1500 ක් සිටින බවට අභිධර්ම දේශනාවේ සඳහන් වේ. ඉහත සඳහන් සතතවිධ මෛථුන ධර්මයන් මෙයාකාරයට සියුම් ආකාරයට පෙන්වා දෙන දහමක් තවත් ලෝකේ කොහේවත් තිබේද ?නැත. මෙය ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම සමානයි. මාරයාගෙන් මිදීමට නිවන් මගට යොමුවීමට තිබෙන ප්‍රධාන දොරටුවයි. මෙකී කරුණු කාරණාවන්ගෙන් එකක් හෝ බිඳී නම් ඔහු හෝ ඇය භයානක සසර දුකින් මිදුනා නොවේ. ජාති, ජරා, ව්‍යාධි, මරණයෙන් මිදුනා නොවේ. නැවත නැවත මෙලොව පරලොව වශයෙන් නොයෙක් විපත්වලට පත් වන්නේය.

මීට මෙතැති,


**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**
ශ්‍රී කල්‍යාණී ධර්ම ආශ්‍රමය,
49, ආබෘ පාර,
කළුතර උතුර.
දුර : 071 7403000
072 4609546
www.dahamnena.lk


24-10-2018 පසළොස්වක දා



**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

**"අපපමාදෙන භික්ඛවෙ සමපාදෙථ**
**දුලලභො බුදධුපපාදො ලොකසමිං**
**දුලලභො මනුසසතත පටිලාභො**
**දුලලභා ඛන සමපතති**
**දුලලභා පබබජජා**
**දුලලභං සදධමම සවණං**
**දුලලභො සපපුරිස සඬෙසවො**

මෙයට විසි අසඞඛ්‍ය කල්ප ලක්‍ෂයකට පෙර අකනිට්ඨ බ්‍රහමරාජයකු විසින් තම මව පිට මත තබාගෙන පරක් තෙරක් නොපෙනන මහා සාගරයෙ දිවා රාත්‍රී සත්දිනක් මව සෙනෙහසින් භියක්, සැකක්, වෙහෙසක් නොමැතිව පිහිනන වීර පුරුෂයෙක් දුක මෙම පුද්ගලයා එසේ මෙසේ කෙනෙක් නොවෙයි. අති දීර්ඝ කාලයකින් බුදුරජාණන් වහන්සේ නමක් ලෝ පහළ වීම නොවුන නිසා අපගෙ පඤ්ච සුද්ධාවාස ක්‍ෂය වෙමින් යන්නේ ය. ලොවට යහපතක් නැත. සකල සත්ත්වයාට පිළිසරණක් නැත්තේ ය. එම නිසා මෙම වීරවන්තයා බුදුවීමට යොමු කිරීමට සුදුසු ම කෙනෙකි. එය මා සතු වගකීමකියි සිතා වහා ක්‍රියාත්මක වී එතුමාට ඒ සඳහා කරුණු පෙන්වා දී එම වීර පුරුෂයා බුදු බව පතා එතැන් සිට සසර සැරිසරා සමතිස් පාරමී දහම් පුරා අපගේ ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ වූ සේක.

## බ්‍රහ්මචර්‍යාව පිරීම

බ්‍රහ්මචර්‍ය්‍යාව පිරීම යනු නිවන් මගට පිවිසීමයි යන මාතෘකාව යටතේ ලිපියක් අනුරාධපුර ශ්‍රී ලංකා භික්‍ෂු විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්‍ය්‍ය තුඹුල්ලෙ සීලක්ඛන්ධ නාහිමිපාණන්

වහන්සේගේ නමින් ක්‍රිස්තු වර්ෂ 2014 ජූලි 12 වන ශනිදා බුදුසරණ පුවත්පතේ තිබී, එය මට කියවීමට ලැබුණේ ක්‍රි.ව. 2018 ජූලි සවැනි බුධ දිනයි. එය කියවූ මම එදින ම මම මාගේ පැරණි දැනීම ද සමග මා විසින් සංස්කරණය කරන ලද 2018 මාර්තු පළමුවැනි දින කලඑළි දක්වන ලද ''මහා කප්පින ස්ථවිරයන් වහන්සේ'' නමැති ග්‍රන්ථය සහ තවද මුද්‍රණය කර නැති ''මහා මඞගල සූත්‍ර දේශනාව (අංක 02) ග්‍රන්ථයට ඇතුළත්ව තිබෙන ''සතත මෛථුන සේවනය'' ත් වර්තමානයේ තිබෙන තරුණ අසහනයත්, ක්‍රි.ව. 2018 ජුනි මස 13 වන බුධ දින නිකුත් කරන ලද බුදුසරණ පත්‍රයේ තිබුණ ව්‍යාසුදෙනගේ කථාවත්, එදින ම එම පත්‍රයේ තිබුණ පූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද මාහිමිපාණන් වහන්සේගේ නමින් තිබුණ බුදුදහම විකෘති වීමේ වේගය බහුල වීමත් ආදී තවත් කරුණු කාරනා රාශියක් මුල්කරගෙන මෙම දහම් ග්‍රන්ථය සංස්කරණය කරමි.

එසේම ඉහත නම සඳහන් මාහිමිපාණන් වහන්සේට ගෞරව කිරීමක් වශයෙන් එකී බුදුසරණ වාර්තාව පළමුවත්, දෙවනුව තවත් භයානක පළිබෝධයක් වූ මස් මාංස අනුභවය ගැන සඳහන් ක්‍රිස්තු වර්ෂ 2015 මැයි 03 වැනි ඉරුදින දාතමින් යුත් 'බුදුමඟ පුපත්පතේ සඳහන් **මැවුම් සංකල්පය සම්මා සම්බුදුරජාණන් වහන්සේ පිළිගන්නවා ද?** ය නමින් ප්‍රසිද්ධ වූ ලිපිය සංස්කරණය කරන ලද ආචාර්ය පූජ්‍ය **බුද්ධගයාවේ සිසිලවනූ මෛත්‍රීය හිමිපාණන් වහන්සේට** ගරු කිරීමක් වශයෙන් මෙම ග්‍රන්ථයට ඇතුළත් කර, ඉන්පසු බ්‍රහමචර්යාව රැකීමට බාධාවන කරුණු කාරණා ඇතුළත් විස්තරය තුන්වනුව ග්‍රන්ථය වශයෙන් සකස් කරමි.

## බ්‍රහ්මචර්යාව යනු නිවන් මගට පිවිසීමයි.

බ්‍රහ්මචර්යාව යන මේ වචනයේ සරල තේරුම නම් උසස් හැසිරීම යන්නයි. අප කවුරුත් උසස් හැසිරීමක් ඇතිව ජීවත් වෙන එක සමාජයට බොහොම වැදගත් වෙනවා. සැබැවට ම මේ බ්‍රහ්මචර්යාව යන වචනයෙන් අදහස් වන්නේ ඒ සාමාන්‍ය අර්ථයට වඩා එහා ගිය වැඩිමනත් දෙයක් යන්න මෙහිදී සිතට ගත යුතු



# බ්‍රහ්මචර්යාව

බ්‍රහ්මචර්යාව යනු නිවන් මගට පිවිසීමේ දොරටුවයි. මෙතෙක් පුවත්පත් දෙකක ලිපි දෙකක් සහ පෙරවදන් දේශනා තුළින් පෙන්වා දුන් කරුණු කාරණා හොඳටම ප්‍රමාණවත් යයි සිතමි. ඒ අනුව බ්‍රහ්මචර්යාවට බාධා වන සතත මෛථුන ධර්ම පෙන්වා දෙමින් ඔබගේ වටිනා ජීවිතය යහමගට යොදා නිවනට අප්‍රමාදව පිවිසීමට පහත සඳහන් දේ සම්පූර්ණ කර ගන්න.

### සතතවිධ මෛථුන ධර්මය

1. ස්ත්‍රියකගෙ ශරීරය ස්පර්ශ වන විදියේ ක්‍රියාවන්
2. ක්ලේශ වශයෙන් සිනාසේ ද, කාය සංසර්ග වශයෙන් ගැටීම, ඇලීම, බැඳීම ඇතිකර ගැනීම
3. ස්ත්‍රියක දෙස ඇලීමෙන් (ආශාවෙන්) බලත් ද, ඇයෙග ඇස් දෙක දිහා බලා සිටීම ද
4. යම් සිත්ගත් ස්ත්‍රියක් තමාගෙ දෙනතට නොපෙනී සිනාසේ ද, අඬා ද, ගායනා කෙරේ ද ඒ කෙරෙහි ඇලීම
5. ඉහත සඳහන් කරුණු කාරණාවලින් වැළකුණත්, කලින් එකී සබඳතා තිබී එය සිහිපත් කිරීම
6. ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ පඤ්චකාම කොට්ඨාශයෙන් සහිත වූවාහු කෙළනාහු උපස්ථාන කරන්නා වූ හෝ එහි ඇලේ ද, කැමතිවේ ද, සතුටට පත්වේ ද
7. මෙකී සියලු දෙයින් වෙන්වී මතු සුරංගනාවියන් පතාගෙන දිව්‍ය ලෝකොත්පත්ති පතාගෙන අබ්‍රහ්මචරියාවේ ද, එයින් අපිරිසිදු සිතින් සිටින නිසා බ්‍රහ්මචරියා රැක්කා නොවේ.

අපි හරි යයි සිතා අප මුලාකරන ක්ලේශ මාරයො මෙයාකාරයට

කැරලෙක් ආදී තවත් සත්වයන් මාතෘකා කර ගත්තේ කාලයාගේ තිබෙන දීඝීභාවය අනුවයි. වර්තමාන අප වර්තාමන තත්වය අනුව ගණන් බැලීම නොව, මුහුද ගොඩගැලීම ගැන තිබෙන සමුද්‍රවානිජ ජාතකයත්, කැළණිතිස්ස රජතුමා තම දූ කුමරිය මුහුදට බිලිදීමත් පිළිගැනීම සිදුවූයේ නොබෝදා ආ (2004) සුනාමියෙන් පසුවයි. එසේම සුනාමිය ගැන කියන කථා තව කොපමණ කල් පිළිගනීද. බුදුදහම නිර්මලයි, කිසිවෙකුට අභියෝග කළ නොහැක. වරද තිබෙන්නේ අවබෝධ කර ගැනීමේ නොහැකියාවටයි. එදා ඇත්රජාට දුන් දඬුවම් විපාකය අළු යට සැඟවූ ගිනි පුපුරක් සේ තිබී බුදුබවට පත්වන තුරුත් එහි ශේෂ විපාක තිබේ නම් අප සිතින්, කයින්, වචනවලින් නිරන්තරයෙන් කරගත්තා වූ පාප කර්‍මයන්ගෙන් කවදා මිදෙම්ද ?

එදා බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම්ව ඉපදුන අපමහ බෝසතාණන් වහන්සේ ද තමාගේ නියෝගය උඩ ඇතාට දුන් දඬුවමට මහත් බියට පත්ව එම සිද්ධිය කමටහනට ගෙන කාමරාග ගින්න අන් සැම ගින්නකටම වඩා දරුණුයි, සසරින් මිදෙන්න නොදී සසරම රඳවා මහත් දුක් දෙන ස්ත්‍රිය මාරයාගේ මළපුඩුවක් වැනි යයි අවබෝධ කරගෙන රජ සැප පිළිකුල් කොට අහෝ සසර දුක, සසරින් මිදීම හැර අන් පිහිටක් පිළිසරණක් නැතැයි අවබෝධ කරගෙන වනගත වී භාවනා වඩා ආයු කෙළවර බඹලොව ඉපිද දීඝී කාලයක් එහි ධ්‍යාන සැප විඳ නැවත මනුලොව ස්ත්‍රී ආත්මභාවයක් (ඉටිකුමාරි) ලැබ ඉපදුණි.



වෙනවා. අප බෞද්ධයන් වශයෙන් පුරුදු වී සිටින වැදගත් දෙයක් තමා සැම වැදගත් කටයුත්තක් ම ආරම්භ කරන්නට පෙර පන්සිල් සමාදන් වීම.

මේ අනුව සමහර විට එක ම දවසේ වුණත් වැදගත් කටයුතු දෙක තුනක් ම යෙදී තිබෙනවා නම් ඒ හැම අවස්ථාවකදී ම මුලදී අනුගමනය කෙරෙන චාරිත්‍රය තමා පිරිස පන්සිල් සමාදන් වීම. එයින් අදහස් කරන්නේ එවැනි සැම කටයුත්තක් ම සිල්වත්ව නිවැරදිව ධාර්මිකව සිට එම කාර්යයට මුල පිරීමයි. මේ අනුව සමහර දෙනෙක් කියන කරුණක් නම් සිල්පද පහ කැඩෙන්නේ නැතිව අප ජීවත් වනවා නම් මොකටද නිතර නිතර පන්සිල් සමාදන් වන්නේ කියලා. සත්‍ය වශයෙන් ම කියනවා නම් අපි අපේ ජීවිත හොඳ සිහි බුද්ධියෙන් පවත්වා ගෙන යමින් සිල් පද පහෙන් එකක්වත් කැඩෙන්නට ඉඩ නොදී ජීවත් වෙනවා නම් එහෙම නිතර නිතර පන්සිල් කියවමින් සමාදන් වීම අවශ්‍ය වන්නේ නැහැ. එසේ වුවත් නොයෙක් ගැටලු ප්‍රශ්නවලින් කැකෑරෙමින් අරුම පුදුම දේ නිතර සිදුවන වර්තමාන ලෝකයේ ජීවිත ගත කරන උදවියට දවසේ කටයුතු කරගෙන යනකොට එකම අරමුණක සිත පිහිටුවා ගැනීමේ හැකියාව අඩු වෙනවා. මෙවැනි අවස්ථාවල සිල්පද එකක්, දෙකක් ඉබේටම සිහියෙන් ගිලිහී ගොස් තමා නොදැනුවත්වම එවැනි සිල්පද කැඩෙන්නට, බිඳෙන්නට ඉඩ තිබෙනවා. ඒ නිසා නිතර පන්සිල් පද කියා සමාදන් වෙනවා නම් ඒ තත්ත්වය මගහැරෙනවා. එයට හේතුව තමා සිල්පද සැමවිටම හැම වැඩක් කරන්නට පෙර සිහිපත් වීම. ඒ නිසා පන්සිල් නිතර සමාදන් වෙනවා යන්නෙන් අප අදහස් කළයුතු වන්නේ ඒ ඒ එක් සිල්පදය එසේත් නැතිනම් එයින් කියැවෙන අදහස සිහියට නගාගෙන ම දවස ගත කිරීමයි. එහෙම වුණත් මේ කොපමණ වතාවක් සිල්පද පහ කීවත් එයත් හොඳ සිහියෙන් කීවේ නැතිනම් එයින් ද පලක් වන්නේත් නැහැ. සිල්පද පහේ තිබෙන තෙවැනි සිල්පදය රැකීම මගින් සාමාන්‍යයෙන් අදහස් වන්නේ පරපුරුෂ/පරස්ත්‍රී සේවනයෙන් වැළකීම අනුගමනය කරනවා කියන එකයි. එහෙත් එයට වඩා තවදුරටත් එහා ගිය පුළුල් අදහස් එහි

තිබෙනවා. එම සිල්පදය ගැන මෙහි විස්තර කිරීමට අදහස් කරන්නේ නැහැ.

එය එසේ වුවත් පන්සිල් සමාදානයෙන් එහා ගිය අටසිල් සමාදානයේ දී හෝ දසසිල් සමාදානයේදී පන්සිල් පද අතර ඇති තෙවන සිල්පදය වූ ''කාමෙසු මිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං සමාදියාමි'' යන්න වෙනුවට සඳහන් වන්නේ ''අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි'' යන සිල්පදයයි. මෙම සිල්පදය අටසිල්, ගිහි දසසිල් සමාදානයේ දී ත්, සාමණේර දසසිල් සමාදානයේදීත් ඒ විදියට ම සඳහන් වෙනවා. මෙහි එන බ්‍රහ්මචරියාව හෙවත් අබ්‍රහ්මචරියාවෙන් වැළකීම යන්නෙන් වඩාත් පුළුල් අර්ථයක් දැක්වෙනවා. එය සාමාන්‍ය කතාබහේ දී බ්‍රහ්මචරියාව යන්නෙන් ඉදිරිපත් වන අර්ථයට වඩා වෙනස් වූ අර්ථයක්. උපසම්පන්න භික්ෂූන් වහන්සේගේ බ්‍රහ්මචර්යාව මෙයටත් වඩා දැඩි වූවක් වෙනවා.

වරක් ජේතවනාරාමයේ වැඩසිටි බුදුරජාණන් වහන්සේ හමුවීමට ජානුස්සෝණි නම් වූ බමුණා පැමිණියේ උන්වහන්සේගෙන් මේ බ්‍රහ්මචර්යාව පිළිබඳ ප්‍රශ්නයක් අසා විමසා දැන ගැනීමටයි. බමුණා උන්වහන්සේ සමග සතුටු සාමීචි කතාබහක යෙදිලා අසා සිටිනවා මෙන්න මේ වාගේ ප්‍රශ්නයක්. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්ස, 'ඔබවහන්සේත් තමන් වහන්සේ බ්‍රහ්මචාරී වූවෙක් වෙමියි' කියා ප්‍රතිඥා දෙනවා නේද ? කියලා. මෙයට බුදුරජාණන් වහනසේ විසින් දෙනු ලබන පිළිතුරෙන් තේරුම් ගත හැකි වෙනවා උන්වහන්සේ එහිදී ප්‍රකාශ කරනවා 'බමුණ, යම්කිසි අයෙක් යම් පුද්ගලයෙක් ගැන කැඩීමක් නැතිව, කබර වැනි අඩුපාඩු නැතිව, චරිතය පිළිබඳ වෙනත් පැල්ලම් නැතිව, නොකැළැල් වූ පරිපූර්ණ, පිරිසිදු, බ්‍රහ්මචර්යාව රකිනවා කියා කියයි නම් ඒ අන්කිසිවෙකු ගැන නොව මා ගැනමයි' යන පිළිතුර. මෙයින් අදහස් කරන්නේ බුදුරජාණන් වහනසේ හැම අතින් ම අංගසම්පූර්ණ වූ උතුම් බ්‍රහ්මචර්යාව ආරක්ෂා කරනවා කියන අදහසයි. මෙම පිළිතුරත්



සම්බුද්ධත්වයේ සිටිමින් පිරිනිවන් පානා සේක. පිරිනිවීමට හේතු කාරණාව වනුයේ මෙයට විසිඅසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයකට ඉහත කරන ලද ඇත් රාජයාට දුන් බලවත් අපරාධයයි. එම ඇත් රාජයා වූ අපගේ දෙවන බුදුරජාණන් වහන්සේ වූ මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ ශ්‍රී දේහය මෙතෙක් ආදාහනය වූයේ නැත. එය අදටත් මතු මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ආයුෂ ක්ෂයවන තෙක් ඉන්දියාවේ කුක්කුට සමපාත පර්වත ගුහාවේ ආරක්ෂිතව තැන්පත්ව තිබී මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ දකුණු ශ්‍රී හස්තයෙන් සඳුන් දර සෑයක් මත ආදාහනය වන්නේය. එයින් හටගන්නා දියපට්ටයක් හේතු කොටගෙන පිරිනිවීම සිදුවන්නේය.

බුදුදහම අවබෝධ කර ගැනීමේ ශක්තියක්, නුවණක්, පිනක්, වාසනාවක් නැති පෘතග්ජන මිථ්‍යාදෘෂ්ටින්ට සිතෙන්න පුළුවන් අත්ලක් පිට දරසෑයක් සෑදි මිනියක් ඒ පිට පිළිස්සෙන්නේ කෙසේද ? කියා. ගෞතම බුදුරජාණන් වහන්සේ ලෝ පහළ වූයේ පරමායුෂ අවුරුදු 120 ක් තිබියදී, මෛත්‍රී බෝසතාණන් වහන්සේ ලෝ පහළ වන්නේ පරමායුෂ අවුරුදු ලක්ෂයකට ආසන්න කාලයකයි. එදා මෙදා වෙනස එයින් තේරුම්ගත හැකියි. පැරණි බන පොත්වල සඳහන් වී තිබුණා ඒ මෛත්‍රී බෝසතාණන් වහන්සේගේ මුඛ මණ්ඩලය අඩි හැටපහක් දිග බව. බුදුරජාණන් වහන්සේලාගේ ආයුෂ අනුව කකුසඳ, කෝනාගම, කාශ්‍යප, ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී දේහයන් එම ආයු ප්‍රමාණ කාලවකවානු අනුව වෙනස්වීම ස්වභාව ධර්මතාවයකි. ඒ අනුව කාශ්‍යප මහරහතන් වහන්සේගේ චිතකය සහිත ශ්‍රී දේහය සඳහා ශ්‍රී හස්තය ඉතාමත් ප්‍රමාණවත් ය. මෙය සටහන් කළේ ඔබගේ විචිකිච්ඡාව වර්ධනය වුවොත් නීවරණ පාපකර්මයක් වන නිසා එයින් වළක්වා ගනු පිණිසයි.

මෙයින් ගතයුතු පාඩම නම් විසි අසඞ්ඛ්‍ය යනු පන්සිය පණස් ජාතක කථා වස්තු පෙර භවයන් ගැන අසඞ්ඛ්‍ය ජාතක කථා වස්තු දේශනා කිරීමට තිබියදී එයින් 550 ක් පමණ දේශනා කිරීම්වලට, කුඩමස්සන්, කොකෙක්, කකුළුවෙක් හා අලියෙක්, වඳුරෙක්,

කුලප්පු වි රජතුමා බිම දමා එකී ඇතිනියන් ගිය මග සොයා යනු පිණිස ගස් අතරින් රිංගා යාම තේරුම් ගත් රජතුමා ගසක අත්තක එල්ලී ජීවිතය බේරාගෙන මහත් ලැජ්ජාවෙන් සහ කෝපයෙන් රජවාසලට පැමිණ ඇත් භාරකාරතුමා ගෙන්වා කරුණු විමසීය.

එවිට ඇත් සේනාධිපති ''මහරජතුමනි, උදහස් නොවනු මැනවි. මා භාරයේ සිටින ඉතාම කීකරු ඇත් රාජයා මෙම ඇත් රජුය. මෙයින් සත්වන දවස ගිය පසු එම ඇතාට දෙන දඬුවම ගැන නොබලා හිටපු තැනටම නැවත එන්නේය. එසේ නාවොත් මට කැමති දඬුවමක් දෙන සේක්වා'' යි කියා සිටියේය. එවිට රජතුමා ''එසේ නොවුණොත් තොපට දෙන දඬුවම මම දනිමි'' යි කියා දින හත සිහියේ තබා ගත්හ. දින හයක් ගෙවී ගිය පසු ඇත් රාජයා මහත් භියෙන් යුතුව තමා සිටි තැනටම පැමිණ සිටින බව දැක ඇත් සේනාධිපති රජතුමාට ඒ බැව් දැන්වීය. රජතුමා ද ඇත්හලට පැමිණ ඇතා හඳුනාගෙන ''දැන් තොප මෙම ඇතාගේ කීකරුභාවය මට පෙන්ව'' යි කීහ. ඉන්පසු එතුමා ඇතා රජ මිදුලට රැගෙන ගොස් යකඩ කූඩුවක දර පොල්කටු දමා ගිනි දල්වා යකඩ කූරු රත්පැහැ ගත් පසු රජතුමා ඉදිරියේ ඇතාට නියෝග කරනුයේ ''මෙම අඟුරු කබල හොඬෙන් ගෙන මා කියන තෙක් බිම නොදමා තබාගනු'' යි කී ආකාරයටම හොඬවැල පිළිස්සී, පිළිස්සීත් මහත් වේදනාවෙන් සිටිනු දුටු රජතුමා ''මහා බිම දමව, දමව''යි කී පසු බිමට දැමීය.

එදා රජතුමා වූයේ අම මහා බෝසතාණන් වහන්සේය. ඇත්හල භාරකාරව සිටියේ මතු බුදුවන මෛත්‍රී බෝසතාණන් වහන්සේය. ඇත් රජු වූයේ ගෞතම බුද්ධ ශාසනයේ දෙවන බුදුරජාණන් වහන්සේ වූ කාශ්‍යප මහරහතන් වහන්සේය. ඇතාට නියෝග කර ගිනි කබලට පිළිස්සුනු වේදනාවේ අකුසලය තවමත් විඳවා අවසන් නැත. මහා කල්ප විසි අසඞඛ්‍යයක් ගෙවී මෙම කල්පයෙහි අවසාන සහ පස්වන බුදුරජාණන් වහන්සේ වන භාග්‍යවත් අර්හත් මෛත්‍රී සම්මා සම්බුදු රජාණන් වහන්සේ මහත් ලෝවැඩ කරමින් අවුරුදු 20000 ක් ගිහි ගෙයි වසමින් ද, අවුරුදු 60000 ක් සම්මා



සමග ආරම්භ වන සාකච්ඡාව තුළින් පැහැදිලි වෙනවා මෙම 'බ්‍රහ්මචාරී' යන වචනය මොනතරම් පුළුල් අර්ථයක් ගන්නවා ද කියලා. මේ අවස්ථාවේදී බමුණා බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටිනවා 'භවත් ගෞතමයන් වහන්ස, එසේ නම් එම කැඩීමක් නැතිව, සිදුරක් සොයාගත හැකි හෙවත් අඩුපාඩුවක් නැතිව, කබර වැනි තත්ත්වයක් නැතිව, චරිතය පිළිබඳ වෙනත් පැල්ලම් නැතිව නොකැළැල් වූ පරිපූර්ණ, පිරිසිදු බ්‍රහ්මචර්යාව කුමක්ද ? යන්න මට එහෙමනම් පැහැදිලි කර දෙන්න'' කියා. එහිදී බුදුරජාණන් වහන්සේ මෙම බ්‍රහ්මචර්යාව විස්තර විභාග වශයෙන් පැහැදිලි කර දෙන ආකාරය අංගුත්තර නිකායේ සත්තක නිපාතයේ සඳහන් සත්තමෙථුන සූත්‍රයෙන් අපට දැකගත හැකි වෙනවා.

මෙම සූත්‍ර දේශනාව අනුව බ්‍රහ්මචර්යාව අංග සම්පූර්ණ වීමට නම් බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන ආකාරයට පියවර හතක් දුරට ඇතට තවදුරටත් පුරුදු පුහුණු කළයුතු වෙනවා. සාමාන්‍යයෙන් පොදුවේ තේරුම් ගෙන ඇති පරිදි බ්‍රහ්මචර්යාවෙන් අදහස් කරන්නේ මුලින් ම පෙන්වා දුන් ආකාරයේ සාමාන්‍ය අර්ථයට එහා ගිය වඩාත් පුළුල් අර්ථයක්.

''යම්කිසි අයෙක් ඉහත සඳහන් ආකාරයට මෙම බ්‍රහ්මචර්යාව අනුගමනය කරමින් ස්ත්‍රී පුරුෂ සම්භෝගයක් නොමැතිව, එහි කැඩීමක් නැතිව, සිදුරක් සොයාගත හැකි හෙවත් අඩුපාඩුවක් නැතිව, කෙනෙකුගේ පැහැපත් සමක් මතුපිට ඇති වන කබර වැනි පලුද්දක් වැනි තත්ත්වයක් නැතිව, චරිතය පිළිබඳ වෙනත් පැල්ලම් නොකැළැල් වූ පරිපූර්ණ, පිරිසිදු බ්‍රහ්මචර්යාව ආරක්ෂා කර ගෙන ජීවත් වන විට ඔහු මෙම බ්‍රහ්මචර්යාව අනුගමනය කරන අයෙක් කියා අපට ප්‍රකාශ කළ හැකි ය. ඒත් ජානුස්සෝණී බමුණ, මේ තත්ත්වය බ්‍රහ්මචර්යාවේ එක් පියවරක් පමණයි'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ මෙයින් පැහැදිලි කරන අදහස නම් එපමණකින් ම බ්‍රහ්මචර්යාව සම්පූර්ණ නොවෙනවා කියන එකයි.

දෙවනුව බුදුරජාණන් වහන්සේ පැහැදිලි කර දෙනවා යම්

අයෙක් බ්‍රහ්මචර්යාව ආරක්ෂා කරමියි කියා කිසියම් ප්‍රතිඥාවක් දී එසේ එවැනි ස්ත්‍රී පුරුෂ වශයෙන් සම්භෝගයක් ඇති වෙන්නේත් නැහැ. එසේ වුවත් ස්ත්‍රියක් ලවා තම ශරීරය ඉළීම, පිරිමැදීම, නැහැවීම, අත් පා මිරිකීම ආදී කිසිවෙකුත් නොකළත් ස්ත්‍රියක් සමග අනවශ්‍ය ලෙස සිනාසෙමින්, උකුලු මුකුලු කරමින්, අල්ලාප සල්ලාපයෙහි යෙදෙමින් නොයෙක් විනෝදජනක ක්‍රීඩා කරමින් මහ හඬින් කාලය ගෙවයි නම් එයින් බ්‍රහ්මචර්යාව ආරක්ෂා වෙන්නෙත් නැහැ කියා.

තෙවැනි අවස්ථාව ලෙස බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මුලදී පෙන්වා දුන් තත්ත්වයකට වුවත් පත් නොවී බ්‍රහ්මචර්යාව ගත කරන බවට ප්‍රතිඥා දුන් අයෙක් ස්ත්‍රියක් දෙස මහත් ඕනකමින් බලයි නම් එයිනුත් බ්‍රහ්මචර්යාව ආරක්ෂා වන්නේ නැහැ.

සතරවැනි අවස්ථාව ලෙස බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ ස්ත්‍රියක් පිළිබඳ මෙතෙක් කී කිසිදු ක්‍රමයක් අනුගමනය නොකළත් ස්ත්‍රියක් ප්‍රාකාරයකින් හෝ බිත්තියකින් හෝ පිටත සිට හෝ නොපෙනෙන තැනක වුවත් සිට සිනාසෙන, අඬන, ගී ගයන හඬ අසමින් තෘප්තියක් ලබනවා නම් එයිනුත් බ්‍රහ්මචර්යාව ආරක්ෂා වන්නේ නැහැ.

පස්වැනි අවස්ථාව ලෙස මෙතෙක් කියූ හැම අවස්ථාවකින් ම බ්‍රහ්මචර්යාව රැකගෙන සිටියත් මුලින් පැහැදිලි කරලා දුන් ආකාරයට බ්‍රහ්මචර්යාව ආරක්ෂා කරන බවට ප්‍රතිඥා දුන් අය මීට පෙර යම් අවස්ථාවක මුලින් කී ආකාරයට නොපෙනෙන තැනක සිට සිනාසෙන, අඬන, ගී ගයන හඬ අසමින් තමන් කාලය ගත කළ අයුරු නැවත සිහින කරමින් කාලය ගත කරයි නම් එයිනුත් බ්‍රහ්මචර්යාව ආරක්ෂා වෙන්නේ නැහැ කියා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

සයවැනි අවස්ථාව ගතහොත් මෙතෙක් කී කිසිදු අඩුපාඩුවක් නැතිව බ්‍රහ්මචර්යාව ආරක්ෂා කරන බවට ප්‍රතිඥාවක් දුන් යම් අයෙක්



දෙපාර්ශවයම මරණින් පසු තම අඹුදරුවන් සමගින්ම සතර අපාගත වීම වැළැක්විය නොහැක.

මේවා තේරුම් ගෙන යමෙක් යහමගට ඒමට අදහස් කරන්නේ නම් මුලින් සඳහන් බුදුසරණ ලිපියක් දෙවනුව සඳහන් බුදුමග ලිපියත් කියවා ආදර්ශයට ගෙන කාමෙසු මිච්ඡාචාරා වෙරමණී වෙනුවට අබ්‍රහ්මචරියා වෙරමණී සීලය රකින්න හොඳම අවස්ථාව වර්තමානයෙ පරමායුෂ බොහෝ වේගයෙන් ගෙවී යන්නේ ලෙඩ රෝග බහුලයි. කාම රාග ගින්න කුසගින්නට වඩා දරුණුයි. හිරිඔතප් තිරිසනුන්ටත් අන්තයි. අඹුදරුවන් නඩත්තුවට මුලු කාලයම ගෙව්වත් ඔවුන්ගෙන් තමාට වන කිසිම යහපතක් නැතත් හොඳක් ද නැත. අඹුදරුවන්ගෙන් පසු උපදින අයත් අයහපතටම නැඹුරු වන නිසා තම සිත පාලනය කරගෙන දාන, ශීල, භාවනා ලබා මෙම බුදුසසුන පිහිටාධාර කරගෙන මෙම කල්පයේ අවසානයට පහළවන මෛත්‍රී පිඩක් වූ මෛත්‍රී බුදු සසුනින් සංසාර ගමන නවතා ගැනීමට උත්සාහ ගන්න. අඹුදරුවන් ප්‍රතික්ෂේප කිරීමක් කියනවා නොවෙයි. තමන්ට තමන්වත් නැති සසරින් මිදීම පිණිස බ්‍රහ්මචරියාව රැකීමට තිබෙන මාර්ග පිළිවෙලින් පහත සඳහන් කරමි. ඊට පෙර ඉතිහාසයෙහි සිදුවූ කරුණු කිහිපයක් සඳහන් කරමි.

මවගෙන් ලබාගත් ප්‍රථම විවරණයත්, ඉන් අනතුරු භවයක දී කුසගින්නේ තම කුසින් බිහිකළ පැටවුන් දෙදෙනා ආහාරය පිණිස ගැනීමට සූදානම් වූ ව්‍යාඝ්‍ර දෙනට ගොදුරු වීමත්, ඉන් අනතුරු භවයකදී බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජව ඉපිද රජකම් කරන කාලයෙහි රජතුමාගෙ ප්‍රධාන විනෝදාංශය වූ වනගත අලින් අල්ලා මෙල්ල කිරීම නිසා එක් දිනක් ඇත් සේනාව භාර ඇමති කැඳවා හෙට වනයට යාම පිණිස හොඳ කීකරු ඇත් රාජයකු සූදානම් කරන ලෙස දන්වා ඒ අනුව සේනාවේ සිටි හොඳම ඇතා රජතුමාට භාරදුනි. රජතුමා ද මහත් සතුටින් පසුදින වනගත වී ටික දුරක් යාමේදී, එදින රාත්‍රී වනයෙන් එළියට පැමිණියා වූ අලි පිරිසේ සිටි ඇතින්නියන්ගේ ගඳ ආඝ්‍රාණය කිරීමට ලැබීමෙන් පසු මදකිපී මෙම ඇත් රාජයා

අවසානයේ **පමාදො මච්චුනො පදං** මාරයාට වැය වශයෙන් සසර දුක් ගමන වැඩි වීමයි.

එසේම උපන්දින උත්සව, වැඩිවිය පැමිණීමේ උත්සව, මගුල් උත්සව (Home Coming) උත්සව, වෙනත් උත්සව ගැනත් සඳහන් කරන්න තිබෙන්නේ මුලින් සඳහන් කරන ලද ආකාරයටමයි. විශේෂයෙන් කොටහලු උත්සව වෙනුවෙන් සඳහන් කරන්න තිබෙන්නේ පසුගිය කාලයේ ඇඹිලිපිටියේ සිදුවූ උපදින්න සිටි දරුවෙකුට පියෙකු අහිමිවීම හා ස්ත්‍රියක් කනවැන්දුම් වීම, පොලීසය පිළිකුලට ලක්වීම, වෛද්‍යවරු අවතක්සේරු වීම, අධිකරණය හෑල්ලුවට ලක්වීම, බෞද්ධයා බෞද්ධයාගේ වෛරක්කාරයෙක් බවට පත්වීම ආදී ශෝකජනක සිදුවීමේ මූලිකම හේතුව පඤ්චශීලය තුට්ටුවට ගණන් නොගැනීමයි. එම කරුණු කාරණා නිසයි ඉහත සඳහන් කර තිබෙන්නේ **මාරපාක්ෂික යක්ෂ ප්‍රේතයන්ට** ජයමගුල් කියා සහ **පමාදො මච්ජුනො පදං** ප්‍රමාදය මාරයාට ණයගැති වීමයි. සතර අපා, අටමහ නිරයන්ගේ කිව නොහැකි කාල වකවානු අසීමිත දුක් විඳීම.

### අපපමාදෙ අමතපදං

මාතෘකා ගාථාව අවබෝධ කර ගත්තා නම් මාරයාට ණයක් නෑ, බයත් නෑ. මෙලොවත් ජය ගන්නවා, පරලොවත් ජය ගන්නවා. දුක් භයානක සසර දුකෙන් මිදීමට ලැබුණු මහඟු අවස්ථාව පසේනදී කොසොල් රජතුමා දුටු සිහිනයක් වන ලක්‍ෂයක් වටිනා රත්හඳුන් අරටුවක් කුණු මෝරු හැළියකට හුවමාරු කර ගන්නවා කියන උපමාව වැනි ඇති හැකි අයගෙ මාන්නය නිසා තම දරුවන් උසස් තත්වයට ගෙන ඒම පිණිස තම හත්මුතු පරම්පරාවෙන් එන බෞඬකමත් පාවා දී තමනුත් දරුවනුත් අපාගත වන ආකාරයට නැති බැරි අයත් කොපි කිරීමෙන් ආගම ධර්මය ආරක්‍ෂා කර ගත්තත් ආජීව අෂ්ඨම ශීලය කඩකිරීම නිසා දරිද්‍රතාවයෙන් මිදීම පිණිස සුරාව, සූදුව, (ලොතරැයි) ගණිකා ව්‍යාපාර කුලියට (Rooms) දීම, ධීවර කර්මාන්තය, හොර කිරුම් මිනුම්, බොරු කපටි වැඩ මෙකී



පස්කම් සැපයට (රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ) ගොදුරු වූ එයින් ම සතුටට පත්ව හුදු විනෝදයෙන්, ඊට ගිජුකමින් ජීවත් වන ගිහි ජීවිතයක් ගත කරන ස්ත්‍රියක හෝ පුරුෂයෙකු දැක ඒ පිළිබඳ සතුටක් ඇති කර ගනී නම් එයිනුත් බ්‍රහ්මචර්යාව ආරක්‍ෂා වුණා කියලා කියන්ට බැහැ.

අවසාන හෙවත් හත්වන අවස්ථාව වශයෙන් බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මචර්යාව ආරක්‍ෂා වීමට අවශ්‍ය කාරණයක් පෙන්වා දෙනවා. එය නම් යම්කිසි අයෙක් බ්‍රහ්මචර්යාව ආරක්‍ෂා කරන බවට ප්‍රතිඥාවක් දී මෙතෙක් විස්තර කළ සෑම අවස්ථාවකින් ම සම්පූර්ණ වුවත්, තමා ඒ විදියට බඹසර ආරක්‍ෂා කරගෙන ප්‍රසිද්ධ හෝ අප්‍රසිද්ධ දෙවියෙකු බවට පත්වීමේ ප්‍රාර්ථනාව ඇති කර ගන්නවා නම් එයින් ද බ්‍රහ්මචර්යාව ආරක්‍ෂා නොවන බව.

මෙතෙක් විස්තර කළ අවස්ථා හත දෙස බලන විට පෙනී යන ඉතා වැදගත් කාරණය වන්නේ සාමාන්‍ය මිනිස් හැසිරීම ඉක්මවා උසස් හැසිරීමක් ඇති බ්‍රහ්මචර්යාව ආරක්‍ෂා කිරීම ඉතා සියුම් සුවිශේෂ ප්‍රතිපත්තියක් පිරීම බවයි. අෂ්ටාංග සීලය ද ඇතුළුව ඊටත් ඉහළ යන සීලමය ප්‍රතිපදාවක් පිරීමට ගිවිස ගන්නා සෑම ගිහි පැවිදි අයෙක් ම මෙම ශික්‍ෂාපදය සමාදන් වීම තුළින් බුදුදහමේ ඉගැන්වෙන අවසාන විමුක්තිය වන නිර්වාණය අරමුණු කොට අපේ සිතට එන කෙලෙස් කසට නිසා එම විමුක්තියට බාධාවක් වන රාගය නමැති සිතිවිල්ල මූලික වශයෙන් යටපත් කරවීම මෙයින් බලාපොරොත්තු වන අරමුණ බවයි. ඒ හැරුණු විට එම රාගය තවදුරටත් වර්ධනය වීමකට ඉඩ නොතබා රාගාදී කෙලෙස් යටපත් කිරීමට මේ බ්‍රහ්මචර්යාව පුරුදු පුහුණු කිරීම හේතු වන බව මෙයින් පැහැදිලි කර දෙනවා.

අනුරාධපුර ශ්‍රී ලංකා භික්‍ෂු විශ්වවිද්‍යාලයේ උපකුලපති,
මහාචාර්ය
**තුඹුල්ලේ සීලක්ඛන්ධ නාහිමිපාණන් වහන්සේ**

# මැවුම් සංකල්පය සම්බුදුරදුන් පිළිගත්තා ද?

යුරෝපීය රටක දේශාටන සංචාරයකදී අප හට හමු වූ එක්තරා සුදු අන්‍යාගමික තරුණයකු මෙලෙස අපගෙන් ප්‍රශ්න කර සිටියේය. ඔබවහන්සේලා අදහන බුදුරජාණන් වහන්සේ සියලු සතුන් දෙවියන් වහන්සේ විසින් මවන ලදැයි යන සංකල්පය පිළිගනු ලැබූවාද ? නොඑසේනම් ඇයිද බෞද්ධ සංඝරත්නය ඇතුළු බෞද්ධ ජනතාව මෙතරම් සත්ත්ව මාංශ ගිජුකමකින් අනුභව කරන්නේ ?

තමන් භක්ෂණය කරන සතුන් හැරෙන්නට ඉතිරි සතුන් සුවපත් වේවා ! යනුවෙන් බුදුරදුන් සූත්‍ර ආශ්‍රයෙන් වදාරා ඇත්ද ? අප නම් සතුන්ට කිසිසේත් මෛත්‍රිය වඩන්නේ නැහැ. මක්නිසාද සතුන් මවා ඇත්තේ මිනිසාගේ ආහාරය උදෙසා නිසයි. එහෙත් ඔබලා සියලු සතුන් කෙරෙහි මෛත්‍රිය, කරුණාව වඩමින්ම ඔවුන්ව, ඔවුන්ගේ මරණය රස කරමින් ගිල දමනවා. එය සම්බුදු කරුණා දහමට අනුගත වන්නේ කෙලෙසද ? ඔබලාගේ දහමට අනුව අප දෙකොට්ඨාසයෙන් වඩා වැරදිකරුවන් කවරහුද ? පංචශීලයේ සතරවන සිල්පදය ද කඩා බිඳ දමමින් ඔබලා ඔබලාවම රවටා ගන්නවා නොවේද ?

මෙකී ප්‍රශ්න වැල සඳහා අපගේ පිළිතුරු දීර්ඝ සහ සවිස්තර වුවද බෞද්ධාගම ගැන ද සාමාන්‍ය දැනුමක් ඇති ඔහුට අප පෙන්වා දුන්නේ යේසුස් වහන්සේගේ අවසන් රාත්‍රී භෝජන සංග්‍රහයට තුන් හතර වේල මාංශම භක්ෂණය කරන එවැනි රටකදී වුවත් සිය ගෝලයන්ට පිළිගැන්වූයේ කුමක්ද ?එසේ කරමින් මේ මාගේ මාංශයයි රොටි පිළිගැන්වූයේ ඇයි ? මේ මාගේ රුධිරය බීපල්ලා යනුවෙන් මිදි යුෂ ලබා දුන්නේ කුමකටද යන්න හොඳ හැටි විමර්ශනාත්මකව බලන ලෙසය.

එම පිළිතුරෙන්ම ඔහුගේ ප්‍රශ්නය නිරාකරණයට පත්වූ බව පෙනෙන්නට තිබුණි. යේසුස් වහන්සේද පරම අවිහිංසාවාදියේක බවට කරුණු කාරණා අපහට හැකි පමණින් පෙන්වා දුනිමු.



හෝ වෛරක්කාරයෙක්වයි.

බුදුදහම තුළින් එම දුව හෝ පුතා වෙසතුරු රජතුමාගෙ ජාලිය, ක්‍රිෂ්ණජිනා මෙන් දරුවන් ද යහමගට ගෙන දරුවන්ගේත්, තමන්ගේත් දුක් සංසාර ගමන නිමා කිරීමට ලැබුණු මහඟු අවස්ථාව අහිමි කර ගන්නේ උද්ධච්ච මෝඩකම නිසයි. එය ඇති හැකි අයගෙ උජාරුවයි. ඔවුන් වෙනුවෙන් දරුවන්ගෙන් ලැබෙන්නේ සුදු කෙස් කළු කර තම නිවස හෝ උත්සවශාලාවක (Happy Birthday) කිරීමයි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම නොහඳුනයි. මැරුණු පසු ගෙදරටවත් නොගන්නා මෘත ශරීරය මල්ශාලාවක දින දෙකක් පමණ මාන්නයෙන් යුක්තව ප්‍රදර්ශනය කර පුලුස්සා දමයි. පම්පෝරිය පෙන්වීම පිණිස උත්සවශ්‍රීයෙන් යුක්තව ආදාහන කටයුතු, තුන්මාසෙ දානය, අවුරුද්දෙ දානය පිරිනමයි දෙපාර්ශවයම සතර අපාගත වෙයි.

නැති බැරි අයගෙ චාරිත්‍ර ශීලය ඇති හැකි අයගෙ චාරිත්‍ර සීලයට හාත්පසින් වෙනස් සංස්කෘතියකි. ඔවුන්ට කවුරු හෝ මැරෙනවා නම් අවමඟුල් උත්සවයකි. ආදායම් මාර්ගයකි. සූදු පිටියකි. සුරා වෙළඳාම් පොලකි. දවාලට වඩා රාත්‍රිය ජොලියකි. සතියක් ගෙවෙන තුරු පොලීසියෙන් ප්‍රශ්නයක් නැත. අසල්වැසියන්ට (බේබද්දන් සහ සූදුකරුවන් හැර) හිසරදයකි. පොල් ගස්වලට පාඩුවකි. සතුරු, මිතුරුකම් ඉවත දමයි. ප්‍රභුවරුන් වන දේශපාලකයින්, මත්ද්‍රව්‍ය වෙළෙන්දන්, දේශපාලනයට ප්‍රවේශවීමට බලාපොරොත්තුවෙන් සිටින අයට, නෑදෑ හිතවතුන්ට මුහුණ නොපෙන්වා සිටීමට බැරි කරුණකි.

ජීවත්ව සිටින විට කිසි වටිනාකමක් නොවුණාට මැරුණු පසු වටිනාකම ගුණ වර්ණනාව අසා සිටින යක්ෂ ප්‍රේතයන්ට ජයමඟුල් ය. පූජනීය ස්ථාන වෙනුවෙන් කර තිබෙන කැපකිරීම්, පරිත්‍යාග කිරීම් අසෙන විට මලමිනිය ඇතුලේ තිබෙන අප්‍රද්‍රව්‍ය ඉවත් කර බෙහෙත් කැවරූ පුළුන් නොමැති නම් මලමිනියටත් සිනහ පහළ වන්නේය. අවසානයේ නැටූ තොවිලයකුත් නැත බෙරේ පලුවකුත් නැත. අයවැය පරතරය රජයේ අයවැය පරතරයට සමාන වන්නේ ය.

හොඳ සිතිවිලි, හොඳ වචන, හොඳ ක්‍රියාවන් හි යෙදිය යුතු. සියළු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය, කරුණාව ඇති කර ගත යුතු. මස්, මාංස අනුභව කරන්නේ නම් එය කියවන වාක්‍යයකට පමණක් සීමා වූ මෛත්‍රී කරුණාවකි. දහම ඉගෙනගත යුතු. අසූමහ ශ්‍රාවක, ශ්‍රාවිකාවන්ගේ පූර්ව කථා අසා දැනගත යුතු. තමා සතු බිම් ප්‍රමාණයේ මල්, පළතුරු, ඖෂධ වර්ග, සතුන්ට සහ හොරුන්ට ප්‍රයෝජනය පිණිස බතල, මඤ්ඤොක්කා වැවිය යුතු. ඒ කිසිවක බලාපොරොත්තුවක් තමා තුළ නොතිබිය යුතු. පක්ෂීන්ට අවශ්‍ය ජල පහසුකම් සැපයිය යුතු. තමන්ලාගේ ප්‍රයෝජනය සඳහා විදෙස් රටවලින් ගෙන හෝග වර්ග වෙනුවට මෙරට මිරිස්, එළවළු ආදිය වවාගත යුතු. එසේම ඒවා හොර හතුරන්ගෙන් ආරක්‍ෂා නූනොත් උපේක්‍ෂා පාරමිතාව පිරීම පිණිස කෝප වීම, ශාප කිරීම් නොකළ යුතු. සිතෙන් දාන පාරමිතාව පිරිය යුතු. එසේම වැට මායිම්වල ආවරණය වන ආකාරයට දඹල, මෑ කරල් ආදී හෝග වගාකළ යුතු. සුරතල් පිණිස සතුන් ඇති දැඩි නොකළ යුතු. නිවස තුළ තිබෙන මැසි මදුරු වාසස්ථානයන්ට ඉඩ නොතැබිය යුතු. පිළිකුල් උපන්දින, වැඩිවිය පත්වීම්, හොම්කමින් නමින් ප්‍රසිද්ධ බටහිර තුප්පහි උත්සව නැවැත්විය යුතු. නිවස තුළ ප්‍රිය වචන පමණක් භාවිතා කළ යුතු. හැදෙන වැඩෙන දරුවන්ට ආදර්ශමත් විය යුතු.

එසේම වර්තමාන බෞද්ධ බාල පරපුර ඉතා වේගයෙන් නොමගට ගෙන යන තුප්පහි අධ්‍යාපනට රැවටුණු මාන්නාධික, බලතල තිබෙන, ධන සම්පත් තිබෙන, මෝඩ බෞඬ දෙමාපියෝ අවිද්‍යාවෙන් මුලාවට පත්ව සුපිරි අධ්‍යාපන, ජාත්‍යන්තර පාසල්, විදෙස් අධ්‍යාපන සඳහා තේරුමක් නැති අසීමිත වියදම් කරමින් තම දරුවන් ආලෝකයෙන් අඳුරටම තල්ලු කරනවා පමණක් නොව එම දරුවන් වෙනුවෙන් දෙමාපියන් මැරෙණතෙක් දරුවන්ගෙ බැල මෙහෙවර කිරීම්, පස්පව්, දස අකුසල් කිරීම්, නොකටයුතු වෙළඳාම් ආදියෙන් සපයන ධනය තම දරුවන්ට වඩා දෙමාපියන්ටම අටමහ නිරයෙහි බොහෝ දීර්ඝ කාලාන්තරවල් මහා දුක් විඳින්ට වන්නේ මගෙ දරවා යන නමින් හඳුන්වා ගන්නා පෙර භවයක ණයකාරයෙක්



බොහෝ ප්‍රධාන ආගම් දර්ශනවල එම ශාස්තෘවරුන් ප්‍රකාශ කරන ලද්දේ නොව ප්‍රකාශ නොකළ දෑ පසුකාලීනව දිවග රස තෘෂ්ණාව කිසිසේත් නවතාගත නොහැකි තෘෂ්ණාහරිත පුද්ගලයන් තම තම වාසිය සහ පුද්ගල ජනප්‍රියත්වය තකාම මූලික සිද්ධාන්ත අනිවාර්යයෙන්ම විකෘති කර ලියා ඇති බවද, උන්නාන්සේලා වැඩසිටි කාලවලදී අකුරු ශාස්ත්‍රය නොතිබූ බවද එම නිසා එම ශෝචනීය තත්ත්වය ඇති වූ බවද සුදු ජාතික තරුණයාට පැකිළීමකින් තොරව පිළිගැනීමට සිදු විය.

සුදනනි ! අප සම්බුදු දහමට වී ඇත්තේද මෙයම ය. ඇතැමුන් මරණින් මතු ස්වර්ගයට යෑමට සැරසී සිටින්නේ ද මාංශ රස බලමින් ය. එහෙත් ඔවුන්ගේ අවාසනාවට ස්වර්ග රාජ්‍යවල හෝ මහ බලවන්ත (ඕල්මයිටි) දෙවියන්ගේ රාජ්‍යවල මාංශ ගොවිපළ සහ වෙළෙඳ පොළ, දන්සල් නොමැති නිසා ඔවුන්ට සිදුවන්නේ සදාකල් කුසගින්නේ සිටීමට ය. මක්නිසාද මාංශ රසය නොමැතිව ඔවුන්ට ජීවත් වීමට අපහසු නිසාය.

බුද්ධඝෝෂ නම ඇති මිථ්‍යා දෘෂ්ටික පුද්ගලයා කෙටි සම්බුද්ධ දේශනා දිගුකොට, දිගු දේශනා කෙටිකොට ධර්මයට පරස්පර, පටහැනි දෑ තම සිතැඟි පරිදි විකෘති කොට ලියා මස් ධර්මය ද අනුගතකොට එය බුදුරදුන්ගේ මහා මෛත්‍රිය යැයි සඳහන් කොට ඒවා හිස් මුදුනින් කිසිදු තර්කයක් නොමැතිව පිළිගන්නා බොළඳයන් කොට්ඨාසයක් සදහටම ඇතිකොට වසර පන්දහසක් පවතින සම්බුද්ධ ශාසනය දෙදහස් පන්සීයකින් අවසන් කළා යැයි උදම් ද අනා ඇත. ඇතුන් සය දෙනෙකුගේ බරැති ධර්ම ග්‍රන්ථ විනාශ කරවා ඇත.

ඊරි මාංශ උරමින්, මාංශ කටු සූප්පු කරමින්, සත්ත්ව කුස් තුළ සිටින බිත්තර නමැති කෝටි ගණන් දරු පැටවුන් කිසිදු හිරිකිතයක් නැතිව චර චර ශබ්ද නගා උරා බී, අඟල් සතරේ අනිත්‍ය මහ පොළොවට පත්වන දිව සංතර්පනය කරමින් නිර්වාණය නමැති තෘෂ්ණාවෙන් තොර මාර්ගයට අවතීර්ණ වීමට වර්තමාන බෞද්ධයන්

අන්ධානුකරණයේ යෙදෙන පිළිවෙළ සහ තමන් රවටා ගෙන මංමුළාවී භාවනාවේ යෙදී දඟලනු පසෙක සිට නරඹන අපට ඇතිවනුයේ ධර්ම සංවේගයකි.

මේ අනුව නිර්වාණය කෙතෙක් දුරට සාක්ෂාත් වේදැයි තීරණය බුද්ධිමත් බෞද්ධයිනි ඔබ සතුය. මාංශ දහම තුළ රැඳෙමින් තෘෂ්ණාව නැති කිරීමට පෙරුම් පුරන්නේ සංවෘත කළයුතු පංචේන්ද්‍රියන් සිය නොදැනුවත්කමින් විවෘත කර ගනිමිනි. නිවන ඇතින් ඇතට මෙතෙක් කල් සසරේ ගමන් කර ඇති පරිදිම දිගුකර ගනිති.

තනිකරම වාජීකරණයක් වන සත්ත්ව මාංශවල ධාතු ශක්තිය ශරීර කදම්බය තුළ මෝදු වී තීව්‍ර වන විට බවුන් වඩන්නන්ට ඉරියව්වේ ඉඳ දෙඇස් වසාගත්ත ද ඔවුන්ට පෙනෙන්නේ ශරීරය විසින් සිතට අණදෙන රූපරාමු ය. සාමාන්‍යයෙන් සිදුවිය යුත්තේ සිත ශරීරයට අණ දීමය. මෙතැනදී සිදුවනුයේ එහි අනෙක් පැත්තය.

''සබ්බේ සත්තා භවන්තු සුඛීතත්තා'' එහෙත් ඇතැම් ''සත්තා උදරීයං සුඛීතත්තා'' යනුවෙන් කරණීය මෙත්ත සූත්‍රය වෙනස් කළ යුතුද යන්න අනුවණ අටුවාකාරයන්ගෙන්ම අසා දැනගත යුතුය. අපට නම් මෙය කිසිසේත් නොවැටහේ. එය අප්‍රබංශයකි. මෙවන් සිද්ධාන්ත ගවේශනය කරන සියලු දෙනට තිසරණ සරණයි !

ආචාර්ය පූජ්‍ය බුද්ධගයාවේ
**සිසිලචන්ද්‍ර මෛත්‍රිය හිමිපාණෝ**
ක්‍රි.ව. 2015 මැයි මස 3 වන ඉරිදා
බුදුමග පුවත්පත



# බ්‍රහමචර්යාව

**මා**තෘකා ගාථාවෙහි සඳහන් දුර්ලභම කාරණා වූ අප්‍රමාදව පුණ්‍ය කර්මයෙහි යෙදීම, බුදුසසුනක් ලබාගැනීමේ භාග්‍යය, මිනිසත්භාවය, හේතු සම්පත්තිය, පැවිදිභාවය, සත්පුරුෂ ආශ්‍රය, සද්ධර්මය අවබෝධ කර ගැනීමේ භාග්‍යය. මෙකී දුර්ලභ කාරණා හතෙන් හයක් ම හිමිකරගෙන සිටින උපාසක උපාසිකාවන් දැඩිව සිතට ගත යුතු අඩුව (පැවිද්ද) සම්පූර්ණ කරගත යුතු. ඒ සඳහා මනා සිහිකල්පනාවෙන් යුතුව සිත, කය, වචනය ආර්ය මාර්ගයෙහි ම යෙදිය යුතු. ඒ සඳහා දැඩි දුෂ්කරවූත්, දැඩි වීර්යයෙන් යුතුව පිරිය යුතු පාරමිතාවක් වූ **බ්‍රහ්මචර්යාව** ශීලය, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම මතු කියවෙන්නා වූ දේශනාව පුරුෂයෙක් ස්ත්‍රියක් කෙරෙහිත්, ස්ත්‍රියක් පුරුෂයෙක් කෙරෙහිත් පක්ෂ භේදයකින් තොරව සිතට ගත යුතු.

වර්තමානයෙහි තොරතෝංචියක් නොමැතිව ගුවන් විදුලියෙන්, රූපවාහිනියෙන්, පුවත්පත් මාර්ගයෙන් සහ වෙන වෙන ආකාරයෙන් දිවා රාත්‍රී බන අසන්නට ලැබේ. එනමුත් මාතෘකා ගාථාවේ පෙන්වා දෙන ආකාරයට '**දුලලභං සදධමම සවණං**' කියන වාක්‍ය අනුව තිරිවානා ගල් කන්දකින් මැණික් ගලක් සොයාගන්නා ආකාරයටයි නියම බුදුදහම අවබෝධ කර ගැනීමට ලැබෙන්නේ. එසේම '**දුලලභො සතපුරිස සංසෙවො**' කියන ගාථා පාඨයෙන් කියන ආකාරයට සත්පුරිස ආශ්‍රයත්, එයටත් වඩා දුෂ්කර නියම සත්පුරුෂයා සොයාගැනීම. එසේම **ක්ෂණ සම්පත්තියත්** එයටත් වඩා දුර්ලභයි.

එසේනම් අපි කෙසේද ? මෙකී සම්පත්ති හිමිකර ගන්නේ. සත්‍ය ධර්මය අවබෝධ කර ගන්නේ. සත්පුරිස ලීලාවෙන් පෙනී සිටින කපටි, ස්ත්‍රී, පුරුෂයන් හඳුනා ගන්නේ ? තමා කිසිවිටෙකත් ත්‍රිවිධරත්නයම පිහිටාධාර කර ගත යුතුයි. පස් පව්, දස අකුසල්, නොකටයුතු වෙළඳාමෙන් වැළකිය යුතු. ලද දෙයකින් සෑහීමකට පත් විය යුතුයි. පාන්දර අවදි විය යුතුයි. ඉතා සුළු වේලාවක් හෝ මල් අහුරක් හෝ පූජා කර එක පහණක් හෝ පූජා කර බුදුරජාණන් වහන්සේගේ අනන්ත ගුණ සිහිකර වැඳිය යුතුයි. ගරුසරු කළ යුතු. නිරන්තරයෙන්